**බෙස්ලයින් මාර්ගය ව්‍යාපෘතිය - අදියර III - 2015**

-------------------------------------------------------------

බෙස්ලයින් මාර්ගය ව්‍යාපෘතියේ - අදියර III 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2009 නොවැම්බර් 19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගන්නා ලද තීරණය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

-----------------------------------------------------------------------------

උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගය දක්වා මීටර් 840 ක නව මාර්ගයක් ඉදිකිරීම මඟින් මාර්ග ප්‍රවාහන තදබදය අවම කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 719 ක් වූ අතර ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යායනය කරනු ලැබේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(ඇ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බවත්‍ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

-----------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

-----------------------

අරමුදල් වෙන්කිරීම, සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | රේඛීය අමාත්‍යාංශය විසින් කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|
| | | 2015 වර්ෂය තුළ | 2015 දෙසැම්බර් 31 දක්වා |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ශ්‍රී ලංකා රජය | 96.57 | 96.57 | 525.18 |

2015 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීමක් කර නොතිබුණද, උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය විසින් රු.මිලියන 96.5 ක අග්‍රිමයක් සලසා තිබුණි. ඉන් රු.මිලියන 37.09 ක් වූ වන්දි මුදල් පුද්ගලයන් දෙදෙනෙකුට හා පෙර වර්ෂ වලදී අත්පත් කර ගත් ඉඩම් වෙනුවෙන් ද වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් රු.මිලියන 56.53 ක පොලී මුදල් පුද්ගලයන් තිදෙනෙකුට ගෙවා තිබුණි. තවද වන්දි මුදල් හා පොලී ගෙවීම් මත එකතුව රු.මිලියන 5.95 ක බදු මුදල්ද සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කිරුළපන සිට කොළඹ - හොරණ මාර්ගයේ දුටුගැමුණු මංසන්ධිය දක්වා බේස් ලයින් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2009 වර්ෂයේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් ඉඩම් අත්පත් කර ගැනීමේදී සිදුවූ ආරාවුල් හේතුවෙන් 2012 වර්ෂයේ සිට අත්හැර දමා තිබුණි. හෙක්ටයාර 2.7283 ක් වූ ඉඩම් කැබලි 143 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කර තිබුණද, 2015 දෙසැම්බර් 31 දිනට හෙක්ටයාර් 0.3691 ක් වූ ඉඩම් කැබලි 11 ක් පමණක් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) තවද, ව්‍යාපෘති කාර්යයන් හේතුවෙන් අවතැන්වන ජනතාව සඳහා නිවාස යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීමට රු.මිලියන 1.17 ක මුදලක් 2008 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවා තිබුණි. කෙසේ වුවද, සැලසුම් කාර්යයන් 2015 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබුණි. ව්‍යාපෘතියේ විෂය පථය අඩුකර තිබූ හෙයින් එවැනි නිවාස යෝජනා ක්‍රමයක අවශ්‍යතාවය විගණනයේදී සාධාරණීකරණය කළ නොහැකි විය.